**ලුණුගල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 26 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 17 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දිනද, සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට ලුණුගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.390,000 ක ජල මනු තොගයක් හා රු.101,700 ක වාහන ටයර් තොගයක්, ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කර ගැනිමට කටයුතු කරමි. |
| (ii) | ඉකුත් වර්ෂයේ වැඩ නිමකර තිබුණු අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ නිමි වැඩ රු.1,996,723 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කර ගැනිමට කටයුතු කරමි. |
| (iii) | ඉකුත් වර්ෂයේ වැඩ නිමකර තිබුණු, සූර්ය බලයෙන් ක්‍රියා කරන වීථි පහන් සවිකිරීමේ කර්මාන්තයේ නිමි වැඩ රු.3,922,900 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | මේ වනවිට ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සූර්ය බලශක්ති සමාගමට ගෙවිය යුතු රු.3,922,900 ක් ණයහිමියන් ලෙසට ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුවේ. | ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත. |

(ආ) **විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.64,992,802 ක ඉඩම් හා ගොඩනැඟිලි ශේෂය සඳහා පිළිගත් තක්සේරුකරුවන්ගේ වාර්තා, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා අයිතිය තහවුරු කිරීමේ ලියවිලි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සමීක්ෂණය කිරීම මගින් අයිතිය තහවුරු කිරීමට ඉදිරියේදි කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4 වන වගන්තිය | මියගිය, සේවය අවසන් කළ සහ දැනට සේවයේ සිටින නිලධාරින්ගෙන් අයකරගත යුතු රු.157,925 ක ණය ශේෂ 03 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ණයශේෂ අයකරගත යුතුවේ. | අයකර ගැනීමට නොහැකි බැවින් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීමට යෝජනාවක් ඉදිරිපත් කර ඇත. |
| (ආ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාවට අයත් දේපළ වර්ෂ 05 කට වරක්වත් තක්සේරු කළයුතු වුවද, කඩ කාමර 33 ක් සභාවේ තක්සේරුව මත කුලියට ලබාදී තිබුණු අතර, කඩ කාමර 26 ක් 2014 වර්ෂයට පෙර තක්සේරු මත ලබාදී තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේදි තක්සේරු කිරීමට ලිපි යොමුකර ඇත. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,722,731 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,624,747 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 282,000 | 258,703 | 183,296 | 75,408 | 249,000 | 259,315 | 164,325 | 94,989 |
| (ii) | කුලී | 5,648,194 | 4,957,266 | 4,255,599 | 701,667 | 4,829,950 | 4,070,842 | 2,701,537 | 1,369,305 |
| (iii) | වෙනත් ආදායම් | 2,053,000 | 1,291,890 | 915,976 | 375,914 | 1,945,000 | - | - | - |
| | එකතුව | 7,983,194 | 6,507,859 | 5,354,871 | 1,152,989 | 7,023,950 | 4,330,157 | 2,865,862 | 1,464,294 |

#### 2.2.2 <u>ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 03 කට වඩා පැරණි රු.1,718,563 ක් වූ හිඟ ටෙන්ඩර් කඩ කුලී ආදායම් සහ වසර 05 කට අධික ආදායම් ණය ගැතියෝ රු.17,357,675 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ ආදායම් අය කර ගත යුතුවේ. | ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

#### 2.2.3 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ උසාවි දඩ රු.4,640,256 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු. 1,436,236 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අය කරගත යුතුවේ. | හිඟය අය කරගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඇත. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වසර 05 කට අධික කාලයක සිට පැවත එන ගෙවිය යුතු වියදම් ණය හිමියෝ රු.611,412 ක් හා කර්මාන්ත ණය හිමියෝ රු. 5,144,604 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ණය ශේෂ නිරවුල් කළ යුතුවේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

කාර්ය මණ්ඩල පුරප්පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 04 කට අදාලව සේවක පුරප්පාඩු 05 ක් පැවතුනි. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු පුරවා ගත යුතුවේ. | පුරප්පාඩු පිරවීමට පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් ලුණුගල බස් නැවතුම්පළේ හිස් බිම්කඩක 2015 මැයි මස ඉදිකර තිබුණු කඩ කාමරයක කුලිය නිශ්චය කර, අයකර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු කඩ කුලී අයකර ගත යුතුවේ. | නව තක්සේරුව මත පදනම්ව කුලී මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

**3.5 නිෂ්ක්‍රීය වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 දෙසැම්බර් 08 දින රු.390,000 ක මුදලක් ගෙවා මිලදීගෙන තිබුණු ජල මනු 120 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | අවශ්‍යතාවය මත භාණ්ඩ මිලදී ගත යුතුවේ. | මඩොල්සිම හා යපම්ම ජල ව්‍යාපෘති සංවර්ධනය කර ජල මනු සවිකිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතුවේ. | ඉදිරි වර්ෂයේදි අභ්‍යන්තර විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කරමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | චක්‍රලේඛ උපදෙස් අනුව කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි. |